අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 | +94112785818
info@moe.gov.lk | www.moe.gov.lk

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ යොමුව<br>எனது இல.<br>My Ref. | ED/1/1/6/1 | ඔබේ යොමුව<br>உமது இல.<br>Your Ref. | | දිනය<br>திகதி<br>Date | 2024.02. 27 |

**චක්‍රලේඛ අංකය : 08 / 2024**

සියලුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලුම කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලුම පරිවේණාධිපති හිමිවරුන්,
සියලුම විදුහල්පතිවරුන් වෙත,

## සමස්ත ලංකා පාසල් චිත්‍ර තරගය - 2024

අධ්‍යාපන අමාත්‍යාංශයේ මෙහෙයවීමෙන් වාර්ෂිකව පැවැත්වෙන උක්ත තරගයෙහි 2024 වර්ෂයට නියමිත කොන්දේසි, උපදෙස් සහ නිර්මාණ ඉදිරිපත් කළ යුතු අංශයන් පිළිබඳ තොරතුරු ඇතුළත් මෙම චක්‍රලේඛය, නියමිත තරග සංවිධානය කර පැවැත්වීම සඳහා ඉදිරිපත් කරමි.

02. මේ පිළිබඳව ඔබ පළාතේ/ කලාපයේ/ කොට්ඨාසයේ/ පිරිවෙන් ආයතනයේ/ විදුහලේ අදාළ ශිෂ්‍ය/ශිෂ්‍යාවන්, ගුරුභවතුන්, ගුරු උපදේශකවරුන් සහ විෂය භාර නිලධාරීන් දැනුවත් කර මෙම තරග චක්‍රලේඛය ප්‍රකාරව, ඔවුන්ගේ නිර්මාණ ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු සංවිධානය කරන මෙන් දන්වමි.

වසන්තා පෙරේරා
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

## සමස්ත ලංකා පාසල් චිත්‍ර තරගය 2024

### හැඳින්වීම

දිවයිනේ පාසල්වල චිත්‍ර නිර්මාණකරණයේ දක්ෂතා දක්වන සිසුන්ගේ නිර්මාණාත්මක හා ශිල්පීය කුසලතාවය වර්ධනය කර වින්දනාත්මක ශක්තීන් දියුණු කිරීමත්, ඔවුන් නිර්මාණකරණයට යොමු කිරීම මඟින් චිත්‍ර කලා විෂය පිළිබඳ ප්‍රායෝගික හා විෂයානුබද්ධ අත්දැකීම් රාශියක් ඔවුනට ලබා දීම උදෙසා මෙම තරගය සංවිධානය කෙරේ. පාසල්වල දැනට ක්‍රියාත්මක වන විෂයමාලාවෙහි චිත්‍ර විෂය 6වන ශ්‍රේණියේ සිට 13වන ශ්‍රේණිය දක්වාම ඇතුලත්ව ඇති බැවින්, මෙම චිත්‍ර තරගය මඟින් එම විෂය සංවර්ධනය සඳහා සුවිශේෂී දායකත්වයක් ලැබෙනු ඇත. සිසුන් තුළ යහපත් ආකල්ප පෝෂණය කරමින් ජාතියේ සංවර්ධනය අරමුණු පෙරදැරි කර ගනිමින් දරු දැරියන්ගේ පෞර්ෂය සංවර්ධනය කිරීම උදෙසා ද මෙම තරගය දායක වේ. ඉන් ජාතික මට්ටමින් ඇගයීමට ලක් කෙරෙන සිසුන් උසස් අධ්‍යාපනයට යොමු වීමේ දී ප්‍රමුඛතාවට පත්වේ.

## 1 තරගයට අදාළ පොදු උපදෙස්

### 1.1 සහභාගීත්වය හා ඉදිරිපත් වීම

රජයේ පාසල්වල ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට හා අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ අනුමත පෞද්ගලික පාසල්වල ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ද, සියලු පිරිවෙන් විද්‍යායතනවල ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට හා ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාට ද, ජාත්‍යන්තර පාසල් සහ එවැනි වෙනත් පෞද්ගලික පාසල්වල ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ද මෙම තරගය සඳහා සහභාගී විය හැකි ය.

තරගයට ඉදිරිපත් කරන සෑම නිර්මාණයක් සඳහාම A3 ප්‍රමාණයෙන් යුතු කඩදාසි වර්ගයක් භාවිත කළ යුතු ය. පරිගණක ආශ්‍රයෙන් සිදු කරන ග්‍රැෆික් නිර්මාණ වර්ණ මුද්‍රිත A4 ප්‍රමාණයේ කඩදාසි විය යුතු ය. **<u>එක් සිසුවෙකුට හෝ සිසුවියකට ඉදිරිපත්විය හැක්කේ එක් තරග අංශයකට පමණි.</u>**

කලාප මට්ටමේ දී චිත්‍ර නිර්මාණයක් සඳහා A3 ප්‍රමාණයෙන් යුතු ඕනෑම කඩදාසි වර්ගයක් භාවිත කළ හැකි අතර, ජාතික මට්ටමේ තරගය සඳහා කඩදාසි අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ලබා දේ. තමන් ඉදිරිපත්වන තරග අංශයට අදාළ වර්ණ ගැන්වීමේ ද්‍රව්‍ය හා උපකරණ තරගකරුවන් සපයා ගත යුතු වේ. පළමු අදියරේ දී පාසල් හා කලාප මට්ටමින් තමන් කැමති මාතෘකාවකින් නිර්මාණ ඉදිරිපත් කිරීමට සිසුන්ට හැකියාව ඇත. **<u>ජාතික මට්ටමේ අවසන් අදියරේ දී සෑම තරග අංශයකටම අධ්‍යාපන අමාත්‍යාංශය විසින් මාතෘකා සපයා දෙනු ලැබේ.</u>**

## 1.2 තරග අන්තර්ගතය - 6-13 ශ්‍රේණි සඳහා වෙන් කරන ලද තරග අංශ.

| ශ්‍රේණිය | තරග අංශ | මාධ්‍යය | | |
|---|---|---|---|---|
| | | දියර මාධ්‍යය | සන මාධ්‍යය | කොලාජ්, මිශ්‍ර මාධ්‍යය |
| 6-7 | 1. ප්‍රකාශන චිත්‍ර | √ | √ | √ |
| | 2. මෝස්තර නිර්මාණ | තමන්ට අභිමත මාධ්‍යයකින් | | |
| | 3. ග්‍රැෆික් නිර්මාණ | | | |

| ශ්‍රේණිය | තරග අංශය | දියර මාධ්‍යය | සන මාධ්‍යය | කොලාජ්, මිශ්‍ර මාධ්‍යය |
|---|---|---|---|---|
| 8-9 | 1. ප්‍රකාශන චිත්‍ර | √ | √ | √ |
| | 2. මෝස්තර නිර්මාණ | තමන්ට අභිමත මාධ්‍යයකින් | | |
| | 3. ග්‍රැෆික් නිර්මාණ | | | |

| ශ්‍රේණිය | තරග අංශය | දියර මාධ්‍යය | සන මාධ්‍යය | කොලාජ්, මිශ්‍ර මාධ්‍යය |
|---|---|---|---|---|
| 10-11 | **පින්තාරුකරණ** | | | |
| | 1. ප්‍රකාශන චිත්‍ර (දියර, සන, කොලාජ්, මිශ්‍ර මාධ්‍ය) | √ | √ | √ |
| | 2. සාම්ප්‍රදායික චිත්‍ර ඇසුරින් නව නිර්මාණ | තමන්ට අභිමත මාධ්‍යයකින් | | |
| | 3. භූමි දර්ශන චිත්‍ර | | | |
| | 4. නිශ්චල ද්‍රව්‍ය සම්පිණ්ඩනය | | | |
| | 5. නිශ්චල ද්‍රව්‍ය ඇසුරෙන් නව නිර්මාණ | | | |
| | **මෝස්තර** | | | |
| | 6 දේශීය සාම්ප්‍රදායික සැරසිලි ඒකක ඇසුරෙන් සැරසිලි නිර්මාණ | | | |
| | 7. නව නිර්මාණාත්මක සැරසිලි නිර්මාණ | | | |
| | 8. විවිධ හැඩයේ භාණ්ඩ සඳහා නව්‍යමය නිර්මාණ සැලසුම් ඇඳීම | | | |
| | **ග්‍රැෆික් නිර්මාණය (මුද්‍රිත මාධ්‍යය)** | | | |
| | 9. පෝස්ටර් නිර්මාණ | | | |
| | 10. සන්නිදර්ශන චිත්‍ර | | | |
| | 11. නිශ්පාදන ඇසුරුම්/ දවටන/ ලේබල | | | |
| | 12. පොත් පිටකවර | | | |
| | 13. පුවත්පත් කාටූන් | | | |
| | 14. පරිගණක නිර්මාණ | | | |

| ශ්‍රේණිය | තරග අංශය | දියර මාධ්‍යය | සන මාධ්‍යය | කොලාජ් මාධ්‍යය | මිශ්‍ර මාධ්‍යය |
|---|---|---|---|---|---|
| 12-13 | **පින්තාරුකරණය** | | | | |
| | 1. ප්‍රකාශන චිත්‍ර | √ | √ | √ | √ |
| | 2. සාම්ප්‍රදායික චිත්‍ර ඇසුරින් නව නිර්මාණ | තමන්ට අභිමත මාධ්‍යයකින් | | | |
| | 3. සාම්ප්‍රදායික චිත්‍ර සිතුවම් බලා ඇඳීම | | | | |
| | 4. භූමි දර්ශන - බලා ඇඳීම | | | | |
| | 5. භූමි දර්ශන ඇසුරෙන් නව නිර්මාණාත්මක | | | | |
| | 6. උඩුකය ප්‍රතිරූප චිත්‍ර (ආලේඛ්‍ය) | | | | |
| | 7. නිශ්චල ද්‍රව්‍ය සම්පිණ්ඩනය | | | | |
| | 8. නිශ්චල ද්‍රව්‍ය ඇසුරෙන් නව නිර්මාණ | | | | |
| | මෝස්තර | | | | |
| | 9.සාම්ප්‍රදායික සැරසිලි ඒකක ඇසුරෙන් ද්විමාන සැරසිලි නිර්මාණ | | | | |
| | 10. නව නිර්මාණාත්මක ද්විමාන සැරසිලි නිර්මාණ | | | | |
| | 11. විවිධ හැඩයේ භාණ්ඩ සඳහා නව්‍යමය නිර්මාණ සැලසුම් ඇඳීම | | | | |
| | 12. සාම්ප්‍රදායික සැරසිලි මෝස්තර බලා ඇඳීම | | | | |
| | **ග්‍රැෆික් නිර්මාණය (මුද්‍රිත මාධ්‍යය)** | | | | |
| | 13. පෝස්ටර් නිර්මාණ | | | | |
| | 14. සන්නිදර්ශන චිත්‍ර | | | | |
| | 15. පොත් පිටකවර | | | | |
| | 16. නිෂ්පාදන ඇසුරුම්/ දවටන/ ලේබල | | | | |
| | 17. පුවත්පත් කාටූන් | | | | |
| | 18. පරිගණක නිර්මාණ | | | | |

## 2 මාධ්‍යය වර්ගීකරණය

### 2.1 ප්‍රකාශන චිත්‍ර නිර්මාණකරණයේ දී පහත සඳහන් පරිදි මාධ්‍යය වර්ගීකරණය සිදු වේ.

දියර මාධ්‍යය - විනිවිද පෙනෙන ලෙස මතු කළ හැකි දිය සායම්, ඇක්‍රිලික් වැනි මාධ්‍යය භාවිතය.
ඝණ මාධ්‍යය - දිය සායම්, පැස්ටල්, ඇක්‍රිලික් පෝස්ටර් සායම්, පෑන් පැන්සල්, කොලාජ්, ෆැබ්රික් වැනි මාධ්‍යය (විනිවිද නොපෙනෙන පරිදි භාවිතය).
කොලාජ් මාධ්‍යය - ඇලවීමේ ශිල්ප ක්‍රමය යටතේ, ද්විමාන මතුපිටක් සහිත මාධ්‍යය හා ද්‍රව්‍ය භාවිතය.
මිශ්‍ර මාධ්‍යය - ඇලවීම, සීරීම, තැවරීම, වැනි ශිල්ප ක්‍රම යටතේ ඉහත දක්වන ඕනෑම මාධ්‍යය දෙකක් හෝ ඊට වඩා වැඩි ප්‍රමාණයක් භාවිතය.

## 3 තරග අංශ හා නිර්ණායක

### 3.1 ප්‍රකාශන චිත්‍ර

6 සිට 13 ශ්‍රේණි දක්වා මෙම තරග අංශය විවෘත ය. 6 සිට 9 ශ්‍රේණිය දක්වා මෙම අංශය සඳහා අභිමත මාධ්‍යයකින් චිත්‍ර ඉදිරිපත් කිරීමේ අවස්ථාව ඇත. 10-11 හා 12-13 ශ්‍රේණි සඳහා ප්‍රකාශන චිත්‍ර නිර්මාණය දියර මාධ්‍යය, ඝන මාධ්‍යය, මිශ්‍ර මාධ්‍යය හා කොලාජ් මාධ්‍යය යන අංශ යටතේ ඉදිරිපත් කිරීමට අවස්ථාව සැලසේ. මෙම නිර්මාණ අංශ සඳහා පහත සඳහන් නිර්ණායක පදනම් කර ගැනේ.

**නිර්ණායක**

- මාතෘකාවට උචිත වාතාවරණය හා පරිසරය දැක්වීම.
- අවකාශය මත රූප සංරචනය කර ඇති ආකාරය.
- ශෛලියට අදාළ සිද්ධාන්ත භාවිතය.
- මාධ්‍ය හා ශිල්ප ක්‍රම භාවිතයේ කුසලතාව.
- භාව ප්‍රකාශනය හා ප්‍රශස්ත නිමාව.

### 3.2 සාම්ප්‍රදායික චිත්‍ර ඇසුරින් නව නිර්මාණ

ලෝකයේ ඉපැරණි සම්ප්‍රදායන් ඇසුරු කරමින් සිදු කරන නව නිර්මාණ මෙම අංශයට අයත් ය. උදා:- අනුරාධපුර හා පොළොන්නරු යුගයේ සිතුවම්, මහනුවර සිතුවම් සම්ප්‍රදායන් සහ මෝගල්, රාජ්පුට් සම්ප්‍රදායන් මෙන් ම, ඊජිප්තු හා ග්‍රීක සිතුවම් ලක්ෂණ ඇසුරින් සකස් කරගත් නව නිර්මාණ මේ යටතට ගැනේ. 10-11 හා 12-13 ශ්‍රේණි සඳහා මෙම තරග අංශය විවෘත ය. සම්ප්‍රදායික සිතුවම් එලෙස ම බලා පිටපත් කිරීම මෙහි දී අපේක්ෂා නොකරේ. මෙම නිර්මාණ අංශය අභිමත මාධ්‍යයකින් ඉදිරිපත් කිරීමට අවස්ථාව සැලසෙන අතර එම නිර්මාණ ඇගයීම සඳහා පහත සඳහන් නිර්ණායක පදනම් කර ගැනේ.

**නිර්ණායක**

- මාතෘකාවට උචිත වාතාවරණය හා පරිසරය දැක්වීම.
- අවකාශය මත රූප සංරචනය කර ඇති ආකාරය.
- ශෛලියට අදාළ සිද්ධාන්ත භාවිතය.
- මාධ්‍යය හා ශිල්ප ක්‍රම භාවිතයේ කුසලතාව.
- නව්‍යතාවය හා ප්‍රශස්ත සියුම් නිමාව.

## 3.3 සාම්ප්‍රදායික චිත්‍ර සිතුවම් කිරීම

12-13 ශ්‍රේණි සඳහා මෙම තරග අංශය විවෘත ය. මහනුවර උඩරට හා පහතරට බිතු සිතුවම් සහ ඉන්දියාවේ මෝගල් හා රාජ්පුට් සිතුවම් බලා ඇඳීම මින් අපේක්ෂිත ය. ට්‍රේසින් කඩදාසි සමඟ අඳිමින් සිදු කරන පිටපත් කිරීමේ ක්‍රියාවලිය මේ සඳහා භාවිත නොකළ යුතු ය. ඉහත දක්වන සම්ප්‍රදායන්ට අයත් සිතුවම් කොටසක් සහිත ඡායාරූපය නිරීක්ෂණයෙන් එහි ගති ලක්ෂණ බලා ඇඳීමට අවස්ථාව සැලසේ. කලාප තරගයේ දී සිසුන් විසින් ගෙන එනු ලබන ඉහත සම්ප්‍රදායන් දැක්වෙන සිතුවම් අතරින් අභිමත එක් වර්ගයකින් යුතු ඡායාරූපයක් බලා ඇඳීමට අවස්ථාව සැලසේ. එසේම ජාතික මට්ටමේ තරගයේ දී මේ සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ලබා දෙන ඉහත සම්ප්‍රදායන්ට අයත් සිතුවමක ඡායාරූපයක් ඇසුරෙන් ඇඳීමට අවස්ථාව සැලසේ. මෙම නිර්මාණ අංශය අභිමත මාධ්‍යයකින් ඉදිරිපත් කිරීමට අවස්ථාව ඇත. එම නිර්මාණ ඇගයීම සඳහා පහත සඳහන් නිර්ණායක පදනම් කර ගැනේ.

**නිර්ණායක**

- මුල් නිර්මාණයට අයත් ලක්ෂණ, වාතාවරණය හා පරිසරය දැක්වීම.
- අවකාශය මත රූප සංරචනය කිරීම.
- ශෛලියට අදාළ සිද්ධාන්ත භාවිතය.
- මාධ්‍යය හා ශිල්ප ක්‍රම භාවිතයේ කුසලතාව.
- ප්‍රශස්ත සියුම් නිමාව.

## 3.4 උඩුකය ප්‍රතිරූප චිත්‍ර (ආලේඛ්‍ය)

12-13 ශ්‍රේණිවල සිසුන් සඳහා ප්‍රතිරූප ඇඳීමේ චිත්‍ර අංශය විවෘත ය. මෙම තරග අංශය සඳහා තමන්ට අභිමත මාධ්‍යයකින් නිර්මාණ ඉදිරිපත් කිරීමට අවස්ථාව සැලසේ. පාසල් හා කලාප මට්ටමේ දී තමන්ට අභිමත මුද්‍රිත පිටපත් හෝ ඡායාරූපයක් බලා ඇඳීමට ඉඩ ලබා දෙන අතර, පළාත් විනිශ්චයෙන් පසු අවසන් තරගය අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් ලබා දෙන ඡායාරූපයක් ඇසුරෙන් සිතුවම් ඇඳීමට යොමු කෙරේ. එම නිර්මාණ ඇගයීම සඳහා පහත සඳහන් නිර්ණායක පදනම් කර ගැනේ.

**නිර්ණායක**

- චරිත හා ගති ලක්ෂණ දැක්වීම.
- පරිමාණුකූල සංරචනය කිරීම.
- ත්‍රිමාණ බව හා සියුම් ලක්ෂණ දැක්වීම.
- මාධ්‍යය හා ශිල්ප ක්‍රම භාවිතයේ කුසලතාව.
- පසුබිම අර්ථවත්ව නිරූපණය හා සමස්ත නිමාව.

## 3.5 භූමි දර්ශන සිතුවම්

භූමි දර්ශන ඇඳීමේ චිත්‍ර අංශය 10-11 සහ 12-13 ශ්‍රේණිවල සිසුන් සඳහා විවෘත ය. 10-11 ශ්‍රේණිවලට අයත් සිසුන් විසින් භූමි දර්ශන ඒ ආකාරයෙන්ම ඇඳීම සිදු කල යුතු අතර, 12 හා 13 ශ්‍රේණි සඳහා මූලික වශයෙන් තරග අංශ දෙකකි. 12-13 ශ්‍රේණි සඳහා භූමි දර්ශන ඒ ආකාරයෙන් ම බලා ඇඳීම හා එම දකින භූමි දර්ශන අභිමත පරිදි නිර්මාණාත්මකව වෙනස් කිරීමට ද අවස්ථාව සැලසේ. මෙහි දී භූමි දර්ශන ඇඳීමේ දී දක්නට ලැබෙන භූමි දර්ශනයේ වර්ණ, රේඛා සහ හැඩතල සම්මත ශාස්ත්‍රාලයීය චිත්‍ර සිද්ධාන්තයන්ට පරිබාහිරව යමින් තමන්ට අභිමත නව නිර්මාණාත්මක ශෛලියක් ගොඩනගාගෙන නිර්මාණ ඉදිරිපත් කිරීම අපේක්ෂා කෙරේ. ජාතික මට්ටමේ තරගයේ දී 10-11 ශ්‍රේණිවලින් ජයග්‍රහණ 33ක් ද, 12-13 ශ්‍රේණිවලින් භූමි දර්ශන බලා ඇඳීමේ ජයග්‍රහණ 60ක් ද, භූමි දර්ශන නිර්මාණාත්මක අංශයෙන් නිර්මාණ 40ක් ද බැගින්, අවසන් වටයට කැඳවනු ලබයි. 6.1හි වගුවට අනුව භූමි දර්ශන ඒ ආකාරයෙන්ම ඇඳීමේ දී හා නිර්මාණාත්මකව භූමි දර්ශන ඇඳීමේ දී ඒ සඳහා අභිමත මාධ්‍යයක් භාවිත කිරීමට අවස්ථාව ඇත. එම තරගය 8.1හි සඳහන් දිනයෙහි තෝරාගත් ස්ථානයක දී පැවැත්වීමට අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් කටයුතු සිදු කෙරෙන අතර අවශ්‍ය කඩදාසි අධ්‍යාපන අමාත්‍යාංශය විසින්ම සපයනු ලැබේ.

**භූමි දර්ශන බලා ඇඳීම සඳහා නිර්ණායක**

- තෝරාගත් දර්ශනය සාර්ථකව තලය මත සංවිධානය කිරීම.
- සිද්ධාන්ත භාවිතය.
- මාධ්‍යය හා ශිල්ප ක්‍රම භාවිතයේ කුසලතාව.
- සියුම් ගති ලක්ෂණ දැක්වීම.
- නව්‍ය හා අර්ථවත් ප්‍රකාශනය.

**නව නිර්මාණාත්මක භූමි දර්ශන ඇඳීම සඳහා නිර්ණායක**

- තෝරාගත් භූමි දර්ශනය නිර්මාණාත්මකව තලය මත සැලසුම් කිරීම.
- හැඩ සම්පිණ්ඩනය සඳහා යොදාගත් ශෛලිය හා විලාසය නිරූපණය කර ඇති ආකාරය.
- වර්ණ මාධ්‍යය, ශිල්ප ක්‍රමවල උචිත බව හා කුසලතාව.
- සම්පිණ්ඩනය කිරීමේ දී හා ගති ලක්ෂණ මතු කිරීමේ දී දක්වන ප්‍රවණතා.
- නව්‍ය හා අර්ථවත් ප්‍රකාශනය.

## 3.6 නිශ්චල ද්‍රව්‍ය සම්පිණ්ඩනය

10-11 සහ 12-13 ශ්‍රේණිවල සිසුන් සඳහා නිශ්චල ද්‍රව්‍ය සම්පිණ්ඩන තරග අංශය විවෘත ය. එහි දී තරගකරුවන්ට සපයන ද්‍රව්‍ය සමූහය බලා ඇඳීම සිදු කෙරෙන අතර ඊට පහත සඳහන් නිර්ණායක පදනම් කර ගැනේ.

**නිර්ණායක**

- ද්‍රව්‍ය සමූහය අර්ථවත්ව තලය මත සම්පිණ්ඩනය කිරීම.
- පරිමාණානුකූලව ද්‍රව්‍ය නිරූපණය හා ගති ලක්ෂණ දැක්වීම.
- සිද්ධාන්ත භාවිතය (පර්යාලෝකය, ත්‍රිමාණත්වය හා ඇස් මට්ටම).
- මාධ්‍යය හා ශිල්ප ක්‍රම භාවිතයේ කුසලතාව.
- පසුතලය හා සමස්ත නිමාව.

## 3.7 මෝස්තර නිර්මාණ

6 සිට 13 ශ්‍රේණි සඳහා මෙම තරග අංශය විවෘත ය. 6 සිට 9 ශ්‍රේණි දක්වා පොදුවේ ද, 10-11 ශ්‍රේණි සඳහා පහත අංක 1 සිට 3 දක්වා වන මෝස්තර නිර්මාණ කොටස් ද, 12-13 ශ්‍රේණි සඳහා පහත අංක 1 සිට 4 දක්වා වන කොටස් ද යටතේ මෙම තරගය පැවැත්වේ. පහත අංශ තුන අතරින් එක් තරග අංශයක් තෝරා ගත යුතු අතර එම තෝරා ගත් අංශයකින් එක් නිර්මාණයක් ඇඳිය යුතුය.

1. **දේශීය සැරසිලි ඒකක භාවිතයෙන් ද්විමාන සැරසිලි නිර්මාණ**
   දේශීය සම්ප්‍රදායික සැරසිලිවල මූලික ලක්ෂණ නිර්මාණාත්මකව භාවිත කර නව සැරසිලි නිර්මාණය කිරීම මෙහි අපේක්ෂාව වේ (උදා:- ව්‍යාප්ත සැරසිලි, මුළුතල සැරසිලි, තිරු සැරසිලි, ධජ පතාක සහ බිත්ති සැරසිලි වැනි නිර්මාණ).

2. **නව නිර්මාණාත්මක ද්විමාන සැරසිලි නිර්මාණ**
   සම්ප්‍රදායික සැරසිලි ඒකක සහ ඒවායේ මූලික ලක්ෂණවලින් බැහැරව නව්‍ය වූ සැරසිලි නිර්මාණය කිරීම අපේක්ෂිත ය (උදා:- ව්‍යාප්ත සැරසිලි මුළුතල සැරසිලි තිරු සැරසිලි, ධජ පතාක සහ බිත්ති සැරසිලි).

3. **විවිධ හැඩයේ භාණ්ඩ සඳහා නව්‍යමය නිර්මාණ සැලසුම් ඇඳීම**
   ත්‍රිමාණ නිර්මාණ සඳහා ආදර්ශ හැඩ ඇඳීම අපෙක්ෂා කෙරෙන අතර අවශ්‍ය නම් මතුපිට අලංකරණය කළ යුතු ය. ඉදිරි පෙනුම පමණක් ඇඳීම ප්‍රමාණවත් ය (උදා:- පාරිභාරික භාණ්ඩ).

එසේම, මෙම නිර්මාණ අංශ තමන්ට අභිමත ඕනෑම මාධ්‍යයක් යටතේ ඉදිරිපත් කිරීමට අවස්ථාව සැලසේ. එම නිර්මාණ ඇගයීම සඳහා පහත සඳහන් නිර්ණායක පදනම් කර ගැනේ.

**නිර්ණායක**

- නිර්මාණ කාර්යයට උචිත අයුරින් නව්‍යතාවකින් සැලසුම් කිරීම.
- පාරිභාරික අවශ්‍යතාවලට ගැළපෙන බව හා කර්මාන්තයට උචිත බව.
- රේඛා සහ හැඩතල අර්ථවත්ව යොදා ගැනීමේ හැකියාව.
- උචිත වර්ණ තෝරා ගැනීම හා මාධ්‍යය භාවිත කිරීමේ කුසලතාව.
- විචිත්‍රත්වය, සියුම් නිර්මාණකරණය හා සාර්ථක නිමාව.

**4. දේශීය සැරසිලි ඒකක බලා ඇඳීම**

පෞරාණික විහාරස්ථානයන්හි ඇඳ ඇති පාරම්පරික බිතුසිතුවම් අතර දක්නට ලැබෙන සිංහල සැරසිලි බලා ඇඳීම මෙහි දී අපේක්ෂා කෙරේ. උදා:- ජ්‍යාමිතික, උද්භිද, නිරූඩ, අර්ධ නිරූඩ යන සැරසිලි වර්ග මෙයට අයත් වේ. ට්‍රේසින් කඩදාසි සමඟ අඳිමින් සිදු කරන පිටපත් කිරීමේ ක්‍රියාවලිය මේ සඳහා භාවිත නොකළ යුතු ය. මෙහි දී ඉහත දක්වන ලද වර්ගයන්ට අයත් සැරසිලි සිතුවම් කොටසක් සහිත ඡායාරූපයක නිරීක්ෂණයෙන් එහි ගති ලක්ෂණ බලා ඇඳීමට අවස්ථාව සැලසේ. කලාප තරගයේ දී සිසුන් විසින් ගෙන එනු ලබන ඉහත සම්ප්‍රදායන් දැක්වෙන සැරසිලි සිතුවම් අතරින් අභිමත එක් වර්ගයකින් යුතු ඡායාරූපයක් බලා ඇඳීමට අවස්ථාව සැලසේ. එසේම ජාතික මට්ටමේ තරගයේ දී මේ සඳහා ලබාදෙන සැරසිලි සිතුවමක ඡායාරූපයක් ඇසුරෙන් බලා ඇඳීමට අවස්ථාව සැලසේ. මෙම නිර්මාණ අංශය අභිමත මාධ්‍යයකින් ඉදිරිපත් කිරීමට අවස්ථාව ඇත. එම නිර්මාණ ඇගයීම සඳහා පහත සඳහන් නිර්ණායක පදනම් කරගනු ලැබේ.

**නිර්ණායක**

- මුල් නිර්මාණයෙහි ගති ලක්ෂණයන්ට සම වන අයුරින් නිර්මාණය කිරීම.
- මුල් නිර්මාණයට සමානුපාතිකව හා පරිමාණානුකූලව තම අනුරුවට යොදා ගැනීමේ හැකියාව.
- රේඛා හැඩතල අර්ථවත්ව යොදා ගැනීමේ හැකියාව.
- උචිත වර්ණ තෝරා ගැනීම හා මාධ්‍යය භාවිත කිරීමේ කුසලතාව.
- විචිත්‍රත්වය, සියුම් නිර්මාණකරණය හා සාර්ථක නිමාව.

## 3.8 ග්‍රැෆික් නිර්මාණ (පෝස්ටර් නිර්මාණ, පොත් පිටකවර, ඇසුරුම් දවටන, ලේබල් හා සන්නිදර්ශන නිර්මාණ)

6 සිට 13 ශ්‍රේණි සඳහා මෙම තරග අංශය විවෘත ය. 6 සිට 9 ශ්‍රේණි දක්වා පොදුවේ ද, ග්‍රැෆික් නිර්මාණ තරගය පැවැත්වෙන අතර එම ශ්‍රේණි සඳහා ඕනෑම ග්‍රැෆික් නිර්මාණයක් ඉදිරිපත් කිරීමට අවස්ථාව සැලසේ. 10-11 හා 12-13 ශ්‍රේණි සඳහා මෙම නිර්මාණ අංශය **<u>පෝස්ටර් නිර්මාණ, පොත් පිටකවර, ඇසුරුම් දවටන, ලේබල් හා සන්නිදර්ශන නිර්මාණ</u>** වශයෙන් කොටස් හතරක් යටතේ වෙන වෙනම තරගය පැවැත්වේ. එසේම මෙම නිර්මාණ අංශය අභිමත මාධ්‍යයක් යටතේ ඉදිරිපත් කිරීමට අවස්ථාව සැලසේ. එම නිර්මාණ ඇගයීම සඳහා පහත සඳහන් නිර්ණායක පදනම් කර ගැනේ.

**නිර්ණායක**

- නිර්මාණ කාර්යය උචිත අයුරින් නව්‍යතාවකින් සැලසුම් කිරීම.
- වාණිජමය හා සන්නිවේදන අවශ්‍යතාවන්ට ගැළපෙන බව කර්මාන්තයට උචිත බව.
- රේඛා හැඩතල අර්ථවත් ව යොදා ගැනීමේ හැකියාව.
- උචිත වර්ණ තෝරා ගැනීම හා මාධ්‍යය භාවිත කිරීමේ කුසලතාව.
- ආකර්ෂණය හා සාර්ථක නිමාව.

## 3.9 කාටූන් නිර්මාණ

10-11 හා 12-13 ශ්‍රේණි සඳහා මෙම තරග අංශය පැවැත්වෙන අතර, අභිමත වර්ණ මාධ්‍යයකින් කලු, සුදු හෝ වර්ණවත්ව ඉදිරිපත් කිරීමට අවස්ථාව සැලසේ. **ජාතික, ආගමික දේශපාලනික හා සංස්කෘතික මෙන්ම පුද්ගල චරිතයන්ට අපහාසයක් හෝ හානියක් සිදු නොවන පරිදි නිර්මාණ ඉදිරිපත් කළ යුතු ය. එසේ නොවන නිර්මාණ ප්‍රතික්ෂේප කරනු ලැබේ.** එම නිර්මාණ ඇගයීම සඳහා පහත සඳහන් නිර්ණායක පදනම් කරගනු ලැබේ.

**නිර්ණායක**

- අන්තර්ගතයට/විෂයට අනුකූලව චරිත නිරූපණය.
- අවකාශය මත රූප සංරචනය කිරීම.
- හාස්‍යය හා චරිත ලක්ෂණ අර්ථවත්ව විදහා පෑම.
- මාධ්‍යය හා ශිල්ප ක්‍රම භාවිතයේ කුසලතාව.
- සමස්ත නිමාවේ සාර්ථකත්වය හා සියුම් බව.

## 3.10 පරිගණක ග්‍රැෆික් නිර්මාණ

10-11 හා 12-13 ශ්‍රේණි සඳහා මෙම තරග අංශය විවෘත ය. පරිගණක ග්‍රැෆික් නිර්මාණ සඳහා යොදා ගන්නා මෘදුකාංග එකක් හෝ කිහිපයක් භාවිත කර පාරිභාරික භාණ්ඩයක් හෝ සන්නිවේදන කාර්යයක් සඳහා මුද්‍රණය කළ හැකි නිර්මාණයක් A4 ප්‍රමාණයට සැලසුම් කර වර්ණ මුද්‍රිත තම පිටපත් චිත්‍ර තරගයට ඉදිරිපත් කළ යුතු ය. කලාප මට්ටමින් තෝරාගත් සිසුන් පරිගණක විද්‍යාගාර සහිත පාසලක හෝ කලාප පරිගණක මධ්‍යස්ථානයකට කැඳවා තරග පැවැත්වීමේ දී අදාළ මධ්‍යස්ථානයේ පරිගණක යන්ත්‍ර සම්පාදනයේ දී අවශ්‍ය සහයට සහ යම් තාක්ෂණික ගැටලුවක දී මැදිහත්වීම සඳහා පමණක් පරිගණක විෂයය නිලධාරියෙකුගේ හෝ පරිගණක විෂයය ගුරු භවතෙකුගේ සහය ලබා ගත යුතු ය. තව ද, මේ කිසිදු තරග අවස්ථාවක අන්තර්ජාලය භාවිතා නොකළ යුතු අතර අධ්‍යාපන කලාප මට්ටමින් සපයන පරිගණක උපාංග හැර වෙනත් මෘදුකාංග හෝ දෘඩාංග භාවිත නොකළ යුතු ය. පරිගණක ආශ්‍රිත ග්‍රැෆික් නිර්මාණ තරගයේ ජයග්‍රාහකයන් සඳහා අවසන් තරගය පැවැත්වීම අධ්‍යාපන අමාත්‍යාංශයෙන් සිදු කෙරේ. එම නිර්මාණ ඇගයීම සඳහා පහත සඳහන් නිර්ණායක පදනම් කර ගැනේ.

**නිර්ණායක**

- ග්‍රැෆික් නිර්මාණයට සුදුසු අන්තර්ගතය.
- වාණිජමය හා සන්නිවේදන අවශ්‍යතාවන්ට ගැළපෙන බව.
- රේඛා හැඩතල අර්ථවත් ව යොදා ගැනීමේ හැකියාව.
- උචිත වර්ණ තෝරා ගැනීම හා මාධ්‍යය භාවිත කිරීමේ කුසලතා.
- ආකර්ෂණීය බව හා සාර්ථක නිමාව.

# 4 තරග සංවිධානය හා ව්‍යුහය හා අදියර

## 4.1 තරග අවස්ථා

සමස්ත ලංකා පාසල් ළමා චිත්‍ර තරගය සංවිධානය කිරීම අවස්ථා 05 කින් යුතුව සිදුවේ.

1. පළමුවන අවස්ථාව - කලාප මට්ටම (අධ්‍යාපන කලාපයේ පාසල් ළමුන්ගෙන් ගෙන්වාගත් නිර්මාණවලින් මූලික විනිශ්චය සිදු කර ජයග්‍රාහකයින් කැඳවා කලාප තරග පැවැත්වීම.
2. දෙවන අවස්ථාව - පළාත් මට්ටම (පළාතේ කලාප අතර චිත්‍ර විනිශ්චය).

3. තෙවන අවස්ථාව - ජාතික මට්ටමේ තරගය සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය මගින් මූලික විනිශ්චය.

4. සිව්වන අවස්ථාව - අධ්‍යාපන අමාත්‍යාංශය මගින් භූමි දර්ශන හා පරිගණක ග්‍රැෆික් නිර්මාණ තරග පැවැත්වීම - (අදියර -1).

5. පස්වන අවස්ථාව - අධ්‍යාපන අමාත්‍යාංශය මගින් ජාතික මට්ටමේ අනෙකුත් තරග අංශ පැවැත්වීම - (අදියර -2).

## 5 චිත්‍ර තරගයට අදාළ කලාප සංවිධාන කටයුතු හා කාර්යභාරය

5.1 තම අධ්‍යාපන කලාපයේ පාසල්වල ඉගෙනුම ලබන සිසුන් මෙම තරගයට සහභාගි කරවීම විදුහල්පතිවරුන්ගේ ද, චිත්‍ර කලා ගුරු උපදේශකවරුන්ගේ ද, කලාපයේ චිත්‍ර කලාව විෂයය භාර නියෝජ්‍ය/සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ගේ ද, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ගේ ද වගකීම වේ.

5.2 සමස්ත ලංකා පාසල් චිත්‍ර තරගයේ එක් එක් අංශ සඳහා ඉදිරිපත් වන සිසු සිසුවියන්ගේ නිර්මාණ පාසල්වලින් කලාප කාර්යාලයට ඉදිරිපත් කිරීමේ අවසන් දිනය 2024 මාර්තු 22 වේ. ඒ අනුව ශ්‍රී ලංකාවේ සෑම අධ්‍යාපන කලාපයකටම අයත් පාසල් මඟින් නිම කරන ලද සිසු නිර්මාණ අදාළ දිනට පෙර, එම පාසල අයත් කලාප අධ්‍යාපන කාර්යාලයට ගෙන්වා ගැනීම සිදු කළ යුතු ය.

5.3 පාසල් මඟින් කලාප අධ්‍යාපන කාර්යාලයට යොමු කරන නිර්මාණ පිටුපස, අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් නිකුත් කරන ලද (උපලේඛන අංක 01) අයදුම්පත්‍රය ඇලවීම හා එහි විදුහල්පතිගේ නිල මුද්‍රාව තබා අත්සන් තැබීම ද අනිවාර්ය වේ.

5.4 කලාප තරග සඳහා නිර්මාණ තෝරා ගැනීමේ විනිශ්චය මණ්ඩලය පත් කිරීම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් සිදු කළ යුතු වේ. චක්‍රලේඛයේ කොන්දේසි ඉක්මවා නොයන පරිදි කලාප තරග ප්‍රතිඵලවල අවසන් තීරක වන්නේ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයා වේ.

5.5 ඒ ඒ තරග අංශ සඳහා කලාප තරගයේ (6.1 හා 6.2හි වගු බලන්න) ප්‍රතිඵල ලේඛන 2024 අප්‍රේල් 23 දිනට පෙර, පළාත් අධ්‍යාපන දෙපාර්තුමේන්තුව වෙත භාරදීම සිදු කළ යුතු වේ. අදාළ කලාපීය ප්‍රතිඵල ලේඛන සකස් කිරීමේ දී අදාළ ජයග්‍රාහකයින්ගේ නාම ලේඛනය කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් සහතික කරනු ලැබූ පිටපත් 02කින් සකස් කර ඉන් එක් පිටපතක් අදාළ ජයග්‍රාහී නිර්මාණ සමඟ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ද, අනෙක් පිටපත අධ්‍යාපන අමාත්‍යංශයේ සෞන්දර්ය අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ද එවිය යුතු ය. තෝරාගත් සෑම චිත්‍රයකම පිටුපස, අමාත්‍යාංශය මඟින් නිකුත් කරන ලද (උපලේඛන අංක 02) අයදුම් පත්‍රය ඇලවීම හා එහි **කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකගේ නිල මුද්‍රාව තැබීම ද අනිවාර්ය වේ.**

5.6 කලාප ප්‍රතිඵලයේ මෘදු පිටපත, අධ්‍යාපන අමාත්‍යාංශයේ සෞන්දර්ය අංශයේ aestheticeducation.moe.lk@gmail.com යන ඊ-මේල් ලිපිනයට එවිය යුතුය.

5.7 කලාප තරග ජයග්‍රාහක ජයග්‍රාහිකාවන් සඳහා සහතික පත්‍ර ලබා දීම ඒ ඒ කලාප අධ්‍යාපන කාර්යාලවලින් සිදු කළ යුතු ය. ප්‍රථම, දෙවන හා තෙවන ස්ථාන ද, අනෙකුත් ජයග්‍රහණ සඳහා විශිෂ්ට කුසලතා සම්මාන ද, කුසලතා සම්මාන ද ලබා දිය යුතු ය. තම පළාතේ ජාතික විනිශ්චයට නිර්මාණ යොමු කරන සියලු සිසුන් සඳහා සහතික පත් ලබා දිය යුතු ය.

# 6 කලාප මට්ටම සඳහා චිත්‍ර තෝරා ගැනීමේ ක්‍රමවේදය

## 6.1 6-11 ශ්‍රේණි සඳහා චිත්‍ර තෝරා ගැනීම

| ශ්‍රේණි | තරග අංශ | මාධ්‍යය | | | එක් කලාපයකින් තෝරන සංඛ්‍යාව | පළාත් විනිශ්චයට යොමු කරන සංඛ්‍යාව | ජාතික විනිශ්චයට යොමු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|
| | | දියර මාධ්‍යය | ඝන මාධ්‍යය | මිශ්‍ර හෝ කොලාජ් මාධ්‍යය | | | |
| 6-7 | 1. ප්‍රකාශන චිත්‍ර | 23 | 20 | 20 | 63 | 63 | 567 (63X9) |
| | 2. මෝස්තර නිර්මාණ | අභිමත වර්ණ මාධ්‍යයකින් | | | 63 | 63 | 567 (63X9) |
| | 3. ග්‍රැෆික් නිර්මාණ | | | | 63 | 63 | 567 (63X9) |
| 8-9 | 1. ප්‍රකාශන චිත්‍ර | දියර මාධ්‍යය | ඝන මාධ්‍යය | මිශ්‍ර හෝ කොලාජ් මාධ්‍යය | 63 | 63 | 567 (63X9) |
| | | 23 | 20 | 20 | | | |
| | 2. මෝස්තර නිර්මාණ | අභිමත වර්ණ මාධ්‍යයකින් | | | 63 | 63 | 547 (63X9) |
| | 3. ග්‍රැෆික් නිර්මාණ | | | | 63 | 63 | 547 (63X9) |
| 10-11 | 1. ප්‍රකාශන චිත්‍ර | දියර මාධ්‍යය | ඝන මාධ්‍යය | මිශ්‍ර හෝ කොලාජ් මාධ්‍යය | 63 | 63 | 547 (63X9) |
| | | 23 | 20 | 10 | | | |
| | 2. සාම්ප්‍රදායික චිත්‍ර ඇසුරින් නව නිර්මාණ | අභිමත වර්ණ මාධ්‍යයකින් | | | 38 | 38 | 342 (38X9) |
| | 3. භූමි දර්ශන ඇඳීම | | | | 33 | 33 | 297 (33X9) |
| | 4. ද්‍රව්‍ය බලා ඇඳීම | | | | 33 | 33 | 297 (33X9) |
| | 5. දේශීය සැරසිලි ඒකක භාවිතයෙන් ද්විමාන සැරසිලි නිර්මාණ | | | | 33 | 33 | 297 (33X9) |
| | 6. නව නිර්මාණාත්මක ද්විමාන සැරසිලි නිර්මාණ | | | | 33 | 33 | 297 (33X9) |
| | 7. විවිධ හැඩයේ භාණ්ඩ සඳහා නව්‍යමය නිර්මාණ සැලසුම් ඇඳීම | | | | 33 | 33 | 297 (33X9) |
| | 8. පෝස්ටර් නිර්මාණ | | | | 38 | 38 | 342 (38X9) |
| | 9. සන්නිදර්ශන නිර්මාණ | | | | 38 | 38 | 342 (38X9) |
| | 10. පොත් පිටකවර | | | | 38 | 38 | 342 (38X9) |
| | 11. ඇසුරුම්, ලේබල් හා දවටන | | | | 38 | 38 | 342 (38X9) |
| | 12. කාටූන් නිර්මාණ | | | | 38 | 38 | 342 (38X9) |
| | 13. පරිගණක ග්‍රැෆික් නිර්මාණ | පරිගණක භාවිතය | | | 20 | 20 | 180 (20X9) |

## 6.2 12-13 ශ්‍රේණි සඳහා චිත්‍ර තෝරා ගැනීමේ ක්‍රමවේදය

| ශ්‍රේණි | තරග අංශ | දියර මාධ්‍යය | ඝන මාධ්‍යය | මිශ්‍ර මාධ්‍යය | කොලාජ් මාධ්‍යය | එක් කලාපයකින් තෝරන සංඛ්‍යාව | කලාප අතරින් පළාත් තරගයට යොමු කරන සංඛ්‍යාව | පළාත් අතරින් ජාතික විනිශ්චයට යොමු කරන සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|---|
| 12-13 | 1. ප්‍රකාශන චිත්‍ර | 20 | 20 | 20 | 20 | 80 | 80 | 720 (80X4X9) |
| | 2. සාම්ප්‍රදායික චිත්‍ර ඇසුරින් නව නිර්මාණ | අභිමත වර්ණ මාධ්‍යයකින් | | | | 60 | 60 | 720 (80X9) |
| | 3. සාම්ප්‍රදායික චිත්‍ර සිතුවම් කිරීම | | | | | 30 | 30 | 270 (30X9) |
| | 4. භූමි දර්ශන - බලා ඇඳීම | | | | | 50 | 50 | 450 (50X9) |
| | 5. භූමි දර්ශන - නිර්මාණාත්මක | | | | | 20 | 20 | 180 (20X9) |
| | 6. උඩුකය ප්‍රතිරූප චිත්‍ර (ආලේඛ්‍ය) | | | | | 50 | 50 | 450 (50X9) |
| | 7. නිශ්චල ද්‍රව්‍ය සම්පිණ්ඩනය | | | | | 50 | 50 | 450 (50X9) |
| | 8. දේශීය සැරසිලි ඒකක භාවිතයෙන් ද්විමාන සැරසිලි නිර්මාණ | | | | | 50 | 50 | 450 (50X9) |
| | 9. නව නිර්මාණාත්මක ද්විමාන සැරසිලි නිර්මාණ | | | | | 50 | 50 | 450 (50X9) |
| | 10. විවිධ හැඩයේ භාණ්ඩ සඳහා නව්‍යමය නිර්මාණ සැලසුම් ඇඳීම | | | | | 50 | 50 | 450 (50X9) |
| | 11. පෝස්ටර් නිර්මාණ | | | | | 30 | 30 | 270 (30X9) |
| | 12. සන්නිදර්ශන නිර්මාණ | | | | | 30 | 30 | 270 (30X9) |
| | 13. පොත් පිටකවර | | | | | 30 | 30 | 270 (30X9) |
| | 14. ඇසුරුම්ල ලේබල් හා දවටන | | | | | 30 | 30 | 270 (30X9) |
| | 15. කාටුන් නිර්මාණ | | | | | 10 | 10 | 90 (10X9) |
| | 16. පරිගණක ග්‍රැෆික් නිර්මාණ | පරිගණක භාවිතය | | | | 20 | 20 | 180 (20X9) |

## 7 චිත්‍ර තරගයට අදාළ පළාත් සංවිධාන කටයුතු හා කාර්යභාරය

7.1 මෙම චක්‍රලේඛයේ කොන්දේසීන්ට යටත්ව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයාගේ උපදෙස් මත පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ චිත්‍ර විෂයභාර අධ්‍යක්ෂ තම පළාතේ සැම අධ්‍යාපන කලාපයකින්ම තෝරා එවන චිත්‍ර ලබාගෙන ජාතික වටයට තෝරා ගැනීමේ කටයුතු සංවිධානය කිරීම හා අධීක්ෂණය කිරීම සිදු කළ යුතු වේ. **ජාතික මට්ටමට යොමුකිරීම සඳහා කලාප කාර්යාල මඟින් එවන චිත්‍ර විනිශ්චය පමණක් සිදුකර** (6.1 සහ 6.2හි වගු බලන්න) 5.1 හා 5.2හි කොන්දේසි අනුව ජයග්‍රාහී නාමලේඛන අධ්‍යාපන අමාත්‍යාංශයේ සෞන්දර්ය අධ්‍යක්ෂ වෙත එවිය යුතු ය **(කලාප මඟින් තෝරා ගන්නා ලද චිත්‍ර නිර්මාණ හා අදාළ ප්‍රතිඵල ලේඛන එකිනෙකට සමාන බවට සහතික කරගත යුතු ය).**

### 7.1.1 6-11 ශ්‍රේණි සඳහා කලාප සහ පලාත් මට්ටමින් සහතික ලබා දීම

| ශ්‍රේණි | තරග අංශ | මාධ්‍යය | ප්‍රථම ස්ථානය | දෙවන ස්ථානය | තෙවන ස්ථානය | විශිෂ්ය කුසලතා සම්මාන | කුසලතා සම්මාන | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| 6-7 | 1. ප්‍රකාශන චිත්‍ර | දියර | 01 | 01 | 01 | 15 | 05 | **23** |
| | | ඝණ | 01 | 01 | 01 | 15 | 02 | **20** |
| | | මිශ්‍ර කොලාජ් | 01 | 01 | 01 | 15 | 02 | **20** |
| | 2. මෝස්තර නිර්මාණ | අභිමත වර්ණ මාධ්‍යයකින් | 01 | 01 | 01 | 35 | 25 | **63** |
| | 3. ග්‍රැෆික් නිර්මාණ | අභිමත වර්ණ මාධ්‍යයකින් | 01 | 01 | 01 | 35 | 25 | **63** |
| 8-9 | 1. ප්‍රකාශන චිත්‍ර | දියර | 01 | 01 | 01 | 15 | 05 | **23** |
| | | ඝණ | 01 | 01 | 01 | 15 | 02 | **20** |
| | | මිශ්‍ර කොලාජ් | 01 | 01 | 01 | 15 | 02 | **20** |
| | 2. මෝස්තර නිර්මාණ | අභිමත වර්ණ මාධ්‍යයකින් | 01 | 01 | 01 | 35 | 25 | **63** |
| | 3. ග්‍රැෆික් නිර්මාණ | | 01 | 01 | 01 | 35 | 25 | **63** |
| 10-11 | 1. ප්‍රකාශන චිත්‍ර | දියර | 01 | 01 | 01 | 15 | 05 | **23** |
| | | ඝණ | 01 | 01 | 01 | 15 | 02 | **20** |
| | | මිශ්‍ර කොලාජ් | 01 | 01 | 01 | 15 | 02 | **20** |
| | 2. සාම්ප්‍රදායික චිත්‍ර ඇසුරින් නව නිර්මාණ | අභිමත වර්ණ මාධ්‍යයකින් | 01 | 01 | 01 | 25 | 10 | **38** |
| | 3. භූමි දර්ශන චිත්‍ර | | 01 | 01 | 01 | 20 | 10 | **33** |
| | 4. නිශ්චල ද්‍රව්‍ය සම්පිණ්ඩනය | | 01 | 01 | 01 | 20 | 10 | **33** |
| | 5. දේශීය සැරසිලි ඒකක භාවිතයෙන් සැරසිලි නිර්මාණ | | 01 | 01 | 01 | 20 | 10 | **33** |
| | 6. නව නිර්මාණාත්මක සැරසිලි නිර්මාණ | | 01 | 01 | 01 | 20 | 10 | **33** |
| | 7. විවිධ හැඩයේ භාණ්ඩ සඳහා නව්‍යමය නිර්මාණ සැලසුම් ඇඳීම | | 01 | 01 | 01 | 20 | 10 | **33** |
| | 8. පෝස්ටර් නිර්මාණ | | 01 | 01 | 01 | 25 | 10 | **38** |
| | 9. සන්නිදර්ශන නිර්මාණ | | 01 | 01 | 01 | 25 | 10 | **38** |
| | 10. පොත් පිටකවර | | 01 | 01 | 01 | 25 | 10 | **38** |
| | 11. ඇසුරුම්, ලේබල් හා දවටන | | 01 | 01 | 01 | 25 | 10 | **38** |
| | 12. කාටූන් නිර්මාණ | | 01 | 01 | 01 | 25 | 10 | **38** |
| | 13. පරිගණක ග්‍රැෆික් නිර්මාණ | පරිගණක භාවිතය | 01 | 01 | 01 | 16 | 10 | **29** |

### 7.1.2 12-13 ශ්‍රේණි සඳහා කලාප සහ පලාත් මට්ටමින් සහතික ලබා දීම

| ශ්‍රේණි | තරඟ අංශ | මාධ්‍යය | ප්‍රථම | දෙවන | තෙවන | අනුස්මරණ සම්මාන | විශිෂ්ඨ කුසලතා සම්මාන | කුසලතා සම්මාන | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|
| 12-13 | 1. ප්‍රකාශන චිත්‍ර | දියර මාධ්‍යය | 01 | 01 | 01 | 02 | 10 | 05 | 20 |
| | | ඝණ මාධ්‍යය | 01 | 01 | 01 | 02 | 10 | 05 | 20 |
| | | මිශ්‍ර මාධ්‍යය | 01 | 01 | 01 | 02 | 10 | 05 | 20 |
| | | කොලාජ් මාධ්‍යය | 01 | 01 | 01 | 02 | 10 | 05 | 20 |
| | 2. සාම්ප්‍රදායික චිත්‍ර ඇසුරින් නව නිර්මාණ | අභිමත වර්ණ මාධ්‍යයකින් | 01 | 01 | 01 | 02 | 10 | 05 | 20 |
| | 3. සාම්ප්‍රදායික චිත්‍ර සිතුවම් කිරීම | | 01 | 01 | 01 | 02 | 10 | 05 | 20 |
| | 4. භූමි දර්ශන - බලා ඇඳීම | | 01 | 01 | 01 | 02 | 25 | 20 | 50 |
| | 5. භූමි දර්ශන - නිර්මාණාත්මක | | 01 | 01 | 01 | 02 | 10 | 05 | 20 |
| | 6. උඩුකය ප්‍රතිරූප චිත්‍ර (ආලේඛ්‍ය) | | 01 | 01 | 01 | 02 | 10 | 05 | 20 |
| | 7. නිශ්චල ද්‍රව්‍ය සම්පිණ්ඩනය | | 01 | 01 | 01 | 02 | 25 | 25 | 50 |
| | 8. දේශීය සැරසිලි ඒකක භාවිතයෙන් ද්විමාන සැරසිලි නිර්මාණ | | 01 | 01 | 01 | 02 | 10 | 05 | 20 |
| | 9. නව නිර්මාණාත්මක ද්විමාන සැරසිලි නිර්මාණ | | 01 | 01 | 01 | 02 | 10 | 05 | 20 |
| | 10. විවිධ හැඩයේ භාණ්ඩ සඳහා නව්‍යමය නිර්මාණ සැලසුම් ඇඳීම | | 01 | 01 | 01 | 02 | 10 | 05 | 20 |
| | 11. පෝස්ටර් නිර්මාණ | | 01 | 01 | 01 | 02 | 10 | 05 | 20 |
| | 12. සන්නිදර්ශන නිර්මාණ | | 01 | 01 | 01 | 02 | 10 | 05 | 20 |
| | 13. පොත් පිටකවර | | 01 | 01 | 01 | 02 | 10 | 05 | 20 |
| | 14. ඇසුරුම්, ලේබල් හා දවටන | | 01 | 01 | 01 | 02 | 10 | 05 | 20 |
| | 15. කාටූන් නිර්මාණ | | 01 | 01 | 01 | 02 | 10 | 05 | 20 |
| | 16. පරිගණක ග්‍රැෆික් නිර්මාණ | පරිගණක භාවිතය | 01 | 01 | 01 | 02 | 10 | 05 | 20 |

7.2 පළාත් මට්ටමේ ජයග්‍රාහී සිසු සිසුවියන්ගේ නාම ලේඛන ඔවුන් වෙත පළාත් අධ්‍යාපන කාර්යාලය මඟින් දන්වා යැවිය යුතු අතර, පළාතෙන් තේරී පත්වන ජයග්‍රාහක ජයග්‍රාහිකාවන්ට සහතික ලබා දීම ඒ ඒ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවලින් කළ යුතුය. ප්‍රථම, දෙවන හා තෙවන ස්ථාන ද, අනෙකුත් ජයග්‍රහණ සඳහා අනුස්මරණ සම්මාන ද, විශිෂ්ඨ කුසලතා සම්මාන ද, කුසලතා සම්මාන ද ලබා දිය යුතු ය.

7.3 පළාත් තරග විනිශ්චයේ දී එම විනිශ්චය මණ්ඩලය චක්‍රලේඛයේ 7.1.1 හා 7.1.2හි වගුවල දැක්වෙන සංඛ්‍යා අනුව තෝරා ගැනීම් සිදු කළ යුතු ය.

7.4 ජාතික මට්ටමේ විනිශ්චයට නිර්මාණ තෝරා ගැනීම සඳහා පැවැත්වෙන පළාත් චිත්‍ර විනිශ්චය, පළාත් අධ්‍යක්ෂවරයාගේ උපදෙස් මත පළාත් සෞන්දර්ය අධ්‍යක්ෂ, පළාත් චිත්‍ර කලා විෂය නියෝජ්‍ය/සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් විසින් සුදුසු විනිශ්චය මණ්ඩලයක් යොදාගෙන සිදුකළ යුතු ය.

## 8 චිත්‍ර තරගය පැවත්වීමේ පියවර හා දින වකවානු

### 8.1 පහත සඳහන් දින අනුව සමස්ත ලංකා පාසල් චිත්‍ර තරගාවලියේ විවිධ අවස්ථා සංවිධානය කල යුතු වේ.

- **පළමු අවස්ථාව** - 2024.03.19 දිනට පෙර පාසල් විසින් තෝරාගන්නා නිර්මාණ තම පාසල අයත් අධ්‍යාපන කලාපයේ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂට යොමු කිරීම.
- **දෙවන අවස්ථාව** - කලාප විනිශ්චය මගින් නිර්මාණ තෝරා ගැනීම හා එසේ තෝරාගත් සිසුන් අධ්‍යාපන කලාපයේ තෝරාගත් ස්ථානයකට කැඳවා කලාප මට්ටමේ චිත්‍ර ඇඳීමේ තරග පවත්වා කලාප ප්‍රතිඵල ලේඛන හා නිර්මාණ පළාත් සෞන්දර්ය අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත 2024.04.23 දිනට පෙර භාර දීම.
- **තෙවන අවස්ථාව** - පළාත් මට්ටමේ විනිශ්චය සිදු කර භූමි දර්ශන හා පරිගණක චිත්‍ර ප්‍රතිඵල ලේඛන සහ නිර්මාණ සමග අනෙකුත් තරග අංශයන්ට අයත් ප්‍රතිඵල ලේඛන අධ්‍යාපන අමාත්‍යාංශයේ සෞන්දර්ය අධ්‍යක්ෂ වෙත 2024.05.24 දිනට පෙර භාර දීම.
- **සිව්වන අවස්ථාව** - ජාතික මට්ටමේ තරගයට චිත්‍ර තෝරා ගැනීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ සෞන්දර්ය අංශය මගින් පවත්වන මූලික විනිශ්චය සිදු කිරීමෙන් අනතුරුව තෝරා ගන්නා චිත්‍ර නිර්මාණය කළ සිසු සිසුවියන් කැඳවා 2024 ජුනි මාසයේ 15 සහ 16 දිනයන්හි දී භූමි දර්ශන ජාතික මට්ටමේ තරගය ද (අදියර-1), 2024 ජුනි මාසයේ 29 සහ 30 දෙදින ජාතික තරගය (අදියර-2) ද පැවැත්වීම.

## 9 තරග විනිශ්චය

9.1 කලාප තරග සඳහා තම කලාප/පළාත් සෞන්දර්ය හෝ චිත්‍ර විෂය සම්බන්ධ නිලධාරීන්ගේ නිර්දේශය මත ප්‍රවීණ විනිශ්චය මණ්ඩලයක් පත් කර ගැනීම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් සිදු කළ යුතුය. කලාප තරඟ විනිශ්චයේ පූර්ණ වගකීම කලාප චිත්‍ර විෂය භාර අධ්‍යක්ෂ වෙත පැවරෙන බැවින් ඒ සඳහා චිත්‍ර කලා විෂය අධ්‍යක්ෂවරුන් හෝ ගුරු උපදේශකවරුන් හෝ තිදෙනෙකුගෙන් සමන්විත විනිශ්චය මණ්ඩලයක් පත් කර ගත යුතුය.

9.2 පළාත් තරග වටයේ විනිශ්චයෙ පූර්ණ වගකීම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ චිත්‍ර විෂය භාර අධ්‍යක්ෂ වෙත පැවරේ. ඒ සඳහා විෂය ප්‍රවීණ විනිශ්චය මණ්ඩලයක් එම නිලධාරී මහතාගේ අදාළ පළාත් දෙපාර්තමේන්තුවේ චිත්‍ර විෂය භාර අධ්‍යක්ෂගේ නිර්දේශයන් වගකීම් සහගත හා ප්‍රවීණ විනිශ්චය මණ්ඩලයක් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් පත් කල යුතු ය.

9.3 පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට කලාපවලින් ලද චිත්‍ර පළාතේ මූලික විනිශ්චයට ලක් කර එයින් තෝරා ගත් ජයග්‍රාහී චිත්‍ර නිර්මාණ හා ප්‍රතිඵල ලේඛන අධ්‍යාපන අමාත්‍යාංශයේ සෞන්දර්ය අධ්‍යක්ෂ වෙත එවිය යුතු ය.

9.4 අවසන් තරගය සඳහා ප්‍රවීණ විනිශ්චය මණ්ඩලයක්, අධ්‍යාපන අමාත්‍යාංශයේ සෞන්දර්ය අධ්‍යාපන අධ්‍යක්ෂ විසින්, සෞන්දර්ය ශාඛාවේ චිත්‍ර කලාව පිලිබඳ නියෝජ්‍ය/සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂගේ නිර්දේශය පරිදි පත් කෙරෙනු ඇත.

9.5 2023 වසරේ ප්‍රථම, දෙවන හෝ තෙවන ස්ථාන ලබාගත් සිසුන්ට ද තරගයට ඉදිරිපත් විය හැකි නමුත් 2023 වසරේ ජයග්‍රහණය ලද නිර්මාණයක් මෙම වසරේ ද ඒ අයුරෙන් ම ඉදිරිපත් කළ නොහැකි ය. එසේ ඉදිරිපත් කළ නිර්මාණ තරගයෙන් ඉවත් කෙරේ.

## 10 තරග අංශ ජයග්‍රහණ සඳහා සම්මාන සහතිකපත් ලබා දීම

6.1 හා 6.2හි වගුවලට අනුව ජාතික විනිශ්චයට යොමු කරන ලද ඒ ඒ නිර්මාණ සංඛ්‍යාව අනුව ජාතික වටයෙන් තෝරා ගැනීමට අපේක්ෂිත ජයග්‍රහණ පහත 10.1 සහ 10.2හි වගුවලින් දැක්වේ. ජාතික මට්ටමේ දී සියලු වයස් කාණ්ඩ සඳහා ප්‍රථම, දෙවන සහ තෙවන ස්ථාන ද, අනුස්මරණ සම්මාන ද, විශිෂ්ඨ කුසලතා සම්මාන ද, කුසලතා සම්මාන ද පිරිනැමීමට නියමිතය. ඒ ඒ තරග අංශයන්ට හිමි අනුස්මරණ සම්මාන පහත පරිදි නම් කරනු ලැබේ.

| | | |
|---|---|---|
| පින්තාරුකරණය | - | ජෝර්ජ් කීට් අනුස්මරණ සම්මානය |
| මෝස්තර | - | එල්.ටී.පී. මංජුශ්‍රී අනුස්මරණ සම්මානය |
| ග්‍රැෆික් | - | සෝලියස් මෙන්ඩිස් අනුස්මරණ සම්මානය |

## 10.1 6-11 ශ්‍රේණි සඳහා සම්මාන ලබා දීම

| ශ්‍රේණි | තරඟ අංශ | මාධ්‍යය | ප්‍රථම ස්ථානය | දෙවන ස්ථානය | තෙවන ස්ථානය | අනුස්මරණ සම්මාන | විශිෂ්ඨ කුසලතා සම්මාන | කුසලතා සම්මාන සංඛ්‍යාව | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|
| 6-7 | 1. ප්‍රකාශන චිත්‍ර | අභිමත වර්ණ මාධ්‍යයකින් | 01 | 01 | 01 | 05 | 32 | 20 | **60** |
| | 2. මෝස්තර නිර්මාණ | | 01 | 01 | 01 | 05 | 32 | 20 | **60** |
| | 3. ග්‍රැෆික් නිර්මාණ | | 01 | 01 | 01 | 05 | 32 | 20 | **60** |
| 8-9 | 1. ප්‍රකාශන චිත්‍ර | අභිමත වර්ණ මාධ්‍යයකින් | 01 | 01 | 01 | 05 | 32 | 20 | **60** |
| | 2. මෝස්තර නිර්මාණ | | 01 | 01 | 01 | 05 | 32 | 20 | **60** |
| | 3. ග්‍රැෆික් නිර්මාණ | | 01 | 01 | 01 | 05 | 32 | 20 | **60** |
| 10-11 | 1. ප්‍රකාශන චිත්‍ර | දියර මාධ්‍යයකින් | 01 | 01 | 01 | 05 | 32 | 20 | **60** |
| | | ඝණ මාධ්‍යයකින් | 01 | 01 | 01 | 05 | 32 | 20 | **60** |
| | | මිශ්‍ර කොලාජ් මාධ්‍යයකින් | 01 | 01 | 01 | 05 | 32 | 20 | **60** |
| | 2. සාම්ප්‍රදායික චිත්‍ර ඇසුරින් නව නිර්මාණ | අභිමත වර්ණ මාධ්‍යයකින් | 01 | 01 | 01 | 05 | 27 | 10 | **45** |
| | 3. භූමි දර්ශන චිත්‍ර | | 01 | 01 | 01 | 05 | 15 | 10 | **33** |
| | 4. නිශ්චල ද්‍රව්‍ය සම්පිණ්ඩනය | | 01 | 01 | 01 | 05 | 15 | 10 | **33** |
| | 5. දේශීය සැරසිලි ඒකක භාවිතයෙන් සැරසිලි නිර්මාණ | | 01 | 01 | 01 | 05 | 15 | 10 | **33** |
| | 6. නව නිර්මාණාත්මක සැරසිලි නිර්මාණ | | 01 | 01 | 01 | 05 | 15 | 10 | **33** |
| | 7. විවිධ හැඩයේ භාණ්ඩ සඳහා නව්‍යමය නිර්මාණ සැලසුම් ඇඳීම | | 01 | 01 | 01 | 05 | 15 | 10 | **33** |
| | 8. පෝස්ටර් නිර්මාණ | | 01 | 01 | 01 | 05 | 27 | 10 | **45** |
| | 9. සන්නිදර්ශන නිර්මාණ | | 01 | 01 | 01 | 05 | 27 | 10 | **45** |
| | 10. පොත් පිටකවර | | 01 | 01 | 01 | 05 | 27 | 10 | **45** |
| | 11ඇසුරුම්, ලේබල් හා දවටන | | 01 | 01 | 01 | 05 | 27 | 10 | **45** |
| | 12. කාටූන් නිර්මාණ | | 01 | 01 | 01 | 05 | 15 | 10 | **33** |
| | 13. පරිගණක ග්‍රැෆික් නිර්මාණ | පරිගණක භාවිතය | 01 | 01 | 01 | 05 | 15 | 10 | **33** |

## 10.2 12-13 ශ්‍රේණි සඳහා සම්මාන ලබා දීම.

| ශ්‍රේණි | තරග අංශ | මාධ්‍ය | ප්‍රථම | දෙවන | තෙවන | අනුස්මරණ සම්මාන | විශිෂ්ඨ සම්මාන | කුසලතා සම්මාන සංඛ්‍යාව | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|
| 12-13 | 1. ප්‍රකාශන චිත්‍ර | දියර මාධ්‍ය | 01 | 01 | 01 | 02 | 10 | 05 | **20** |
| | | ඝණ මාධ්‍ය | 01 | 01 | 01 | 02 | 10 | 05 | **20** |
| | | මිශ්‍ර මාධ්‍ය | 01 | 01 | 01 | 02 | 10 | 05 | **20** |
| | | කොලාජ් මාධ්‍ය | 01 | 01 | 01 | 02 | 10 | 05 | **20** |
| | 2. සාම්ප්‍රදායික චිත්‍ර ඇසුරින් නව නිර්මාණ | අභිමත වර්ණ මාධ්‍යකින් | 01 | 01 | 01 | 02 | 10 | 05 | **20** |
| | 3. සාම්ප්‍රදායික චිත්‍ර සිතුවම් කිරීම | | 01 | 01 | 01 | 02 | 10 | 05 | **20** |
| | 4. භූමි දර්ශන - බලා ඇඳීම | | 01 | 01 | 01 | 02 | 30 | 25 | **60** |
| | 5. භූමි දර්ශන - නිර්මාණාත්මක | | 01 | 01 | 01 | 02 | 20 | 15 | **40** |
| | 6. උඩුකය ප්‍රතිරූප චිත්‍ර (ආලේඛ්‍ය) | | 01 | 01 | 01 | 02 | 30 | 25 | **60** |
| | 7. නිශ්චල ද්‍රව්‍ය සම්පිණ්ඩනය | | 01 | 01 | 01 | 02 | 20 | 15 | **40** |
| | 8. දේශීය සැරසිලි ඒකක භාවිතයෙන් ද්විමාන සැරසිලි නිර්මාණ | | 01 | 01 | 01 | 02 | 20 | 15 | **40** |
| | 9. නව නිර්මාණාත්මක ද්විමාන සැරසිලි නිර්මාණ | | 01 | 01 | 01 | 02 | 20 | 15 | **40** |
| | 10. විවිධ හැඩයේ භාණ්ඩ සඳහා නව්‍යමය නිර්මාණ සැලසුම් ඇඳීම | | 01 | 01 | 01 | 02 | 20 | 15 | **40** |
| | 11. පෝස්ටර් නිර්මාණ | | 01 | 01 | 01 | 02 | 20 | 15 | **40** |
| | 12. සන්නිදර්ශන නිර්මාණ | | 01 | 01 | 01 | 02 | 20 | 15 | **40** |
| | 13. පොත් පිටකවර | | 01 | 01 | 01 | 02 | 20 | 15 | **40** |
| | 14. ඇසුරුම්, ලේබල් හා දවටන | | 01 | 01 | 01 | 02 | 20 | 15 | **40** |
| | 15. කාටූන් නිර්මාණ | | 01 | 01 | 01 | 02 | 10 | 05 | **20** |
| | 16. පරිගණක ග්‍රැෆික් නිර්මාණ | පරිගණක භාවිතය | 01 | 01 | 01 | 02 | 10 | 05 | **20** |

මෙම තරගය සඳහා ඉදිරිපත් වන සියලුම තරගකරුවන්, ඔවුන් ඉදිරිපත් කරවන ගුරුභවතුන් සහ අදාළ විදුහල්පතිවරුන් තරගයේ සෑම අවස්ථාවකම තරග චක්‍රලේඛයේ සඳහන් සියලු නීති රීති පිළිපැදීමටත්, විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වශයෙන් පිළිගැනීමටත් බැඳී සිටී.

**(උපලේඛනය 01)**

සිසුන් සඳහා ආදර්ශ අයදුම්පත්‍රය

**<u>සමස්ත ලංකා පාසල් ළමා චිත්‍ර තරගය - 2024</u>**

01. ශිෂ්‍යයා/ශිෂ්‍යාවගේ සම්පූර්ණ නම - ..........................................................................................................

02. මුලකුරු සමඟ නම - ..........................................................................................................

(ඉංග්‍රීසි කැපිටල් අකුරින් සඳහන් කරන්න)

03. පාසල (මව් භාෂාවෙන්) - ..........................................................................................................

(ඉංග්‍රීසි කැපිටල් අකුරින්) - ..........................................................................................................

පාසලේ ලිපිනය - ..........................................................................................................

පාසල් අංකය - ..................................................................

පාසලේ දුරකතන අංකය - ..................................................

03. පෞද්ගලික ලිපිනය - ..........................................................................................................

පෞද්ගලික දුරකථන අංකය - ................................................

04. පළාත - ..........................................................................

05. අධ්‍යාපන කලාපය - ............................................................

06. ඉදිරිපත් වන අංශය - ..........................................................................................................

07. ඉදිරිපත් වන නිර්මාණ මාධ්‍යය - ..........................................................................................

08. නිර්මාණයට අදාළ මාතෘකාව - ..........................................................................................

09. ඉගෙනුම ලබන ශ්‍රේණිය - .....................................................

10. චිත්‍ර කලා ගුරු භවතාගේ නම - ..........................................................................................මයා/මිය.

දුරකථන අංකය - .............................................................

දිනය - ............................................ ........................................................

ශිෂ්‍යයා/ශිෂ්‍යාවගේ අත්සන

---

**විදුහල්පතිගේ නිර්දේශය :-**

පිටුපස සඳහන් නිර්මාණය මෙම ශිෂ්‍යයා/ශිෂ්‍යාවගේ බවත්, අයදුම්පතෙහි සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බවත් සහතික කරමි.

අත්සන :- ................................................

දිනය :- ................................................ ......................................................

නිල මුද්‍රාව

**(උපලේඛනය 02)**

සිසුන් සඳහා ආදර්ශ අයදුම්පත්‍රය

**<u>සමස්ත ලංකා පාසල් ළමා චිත්‍ර තරගය - 2024</u>**

01. ශිෂ්‍යයා/ශිෂ්‍යාවගේ සම්පූර්ණ නම - ...........................................................................................................

02. මුලකුරු සමඟ නම - ...........................................................................................................

(ඉංග්‍රීසි කැපිටල් අකුරින් සඳහන් කරන්න)

03. පාසල (මව් භාෂාවෙන්) - ...........................................................................................................

(ඉංග්‍රීසි කැපිටල් අකුරින්) - ...........................................................................................................

පාසලේ ලිපිනය - ...........................................................................................................

පාසල් අංකය - ...................................................................

පාසලේ දුරකතන අංකය - ..................................................

03. පෞද්ගලික ලිපිනය - ...........................................................................................................

පෞද්ගලික දුරකථන අංකය - ................................................

04. පළාත - ...........................................................................

05. අධ්‍යාපන කලාපය - ...........................................................

06. ඉදිරිපත් වන අංශය - ...........................................................................................................

07. ඉදිරිපත් වන නිර්මාණ මාධ්‍යය - ...........................................................................................................

08. නිර්මාණයට අදාළ මාතෘකාව - ...........................................................................................................

09. ඉගෙනුම ලබන ශ්‍රේණිය - ...................................................

10. චිත්‍ර කලා ගුරු භවතාගේ නම - ...........................................................................................මයා/මිය.

දුරකථන අංකය - ..............................................................

දිනය - ..........................................  ......................................................

ශිෂ්‍යයා/ශිෂ්‍යාවගේ අත්සන

---

**කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ නිර්දේශය :-**

පිටුපස සඳහන් නිර්මාණය මෙම ශිෂ්‍යයා/ශිෂ්‍යාවගේ බවත්, අයදුම්පතෙහි සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බවත් සහතික කරමි.

අත්සන :- ................................................

දිනය :- ................................................  ..............................................................

නිල මුද්‍රාව